නාවික හා සාගරික විද්‍යාපීඨය
නාවික කඳවුර
ත්‍රිකුණාමලය

එන්එම්ජ්/සීඕ/එස්ඊසී/ඒඩීඑම්/බී/4/2022

බෙදාහැරීම බලන්න

2022 ඔක්තෝබර් 22

**අණදෙන නිලධාරීගේ තාවකාලික සංදේශ අංක 30/2022**
**යෝගා මධ්‍යස්ථානය අවට රාජකාරී කිරීම සම්බන්ධයෙන් පනවා ඇති**
**උපදෙස් හා නියෝග**

1. නාවික හා සාගරික විද්‍යාපීඨයට අයත් කොරොල්කෝව් වෙරළ තීරයෙහි නිර්මාණය කර ඇති යෝගා මධ්‍යස්ථානය හා එහි සුන්දරත්වය විඳීමට පැමිණෙන නාවික පුද්ගලයින්ගේ කායික හා මානසික සංවර්ධනය උදෙසා නව මුහුණුවරකින් ආකර්ෂණීය ලෙස නිර්මාණය කර ඇති යෝගා මධ්‍යස්ථානය හා ඒ අවට පරිසරය පිරිසිදුව තබා ගැනීම සඳහා යෝගා මධ්‍යස්ථානයට අනුයුක්තව රාජකාරි නියුතු නාවිකයින් සඳහා පහත සඳහන් උපදෙස් හා නියෝග මෙයින් පැනවේ.

අ. යෝගා මධ්‍යස්ථානයෙහි අවට හා ඇතුලත පිරිසිදුභාවය සම්බන්ධයෙන් අණභාර නිලධාරි ක්‍රිඩා පාසල වෙත පැවරි ඇති අතර, තණ්ඩලේ ගබඩාව භාර නිලධාරි සමග සම්බන්ධ වී කාර්යමණ්ඩලය යොදවා එහි පිරිසිදු තාවය පිළිබඳ අධීක්ෂණය කළ යුතුය.

ආ. යෝගා මධ්‍යස්ථානයේ පවතින අළුත්වැඩියා කටයුතු සම්බන්ධයෙන් අණභාර නිලධාරි ක්‍රිඩා පාසල, අණභාර නිලධාරි සිවිල් ඉංජිනේරු පාසල සහ තණ්ඩලේ ගබඩාවට අනුයුක්ත නාවිකයින් මගින් සතියකට වරක් සොයා බලා නිසි ක්‍රියාමාර්ග ගැනීම සිදු කල යුතුය.

ඇ. යෝගා මධ්‍යස්ථානයේ සියළුම වැඩ සටහන් සම්බන්ධිකරණ කටයුතු සහ පරිපාලන කටයුතු ක්‍රිඩා පාසලේ සහ නැව් කාර්යාලයට අනුයුක්ත පහත නම් සඳහන් නාවික පුද්ගලයින් විසින් සොයා බැලිය යුතු අතර, එම නාවික පුද්ගලයින් වෙනත් ආයතන වෙත නව පත්වීම් ලැබ හෝ මාරු වී ගිය විට අනුප්‍රාප්තික නාවික පුද්ගලයින් විසින් ඒ පිලිබඳව සොයා බැලිය යුතුය.

| | | | | |
|---|---|---|---|---|
| (1) | ලුතිනන්(ස්වේ) | ඩබ්ළුඑම්එන්එම් බණ්ඩාර | එන්වීඑක්ස් | 5851 |
| (2) | නානැවි | එම්එම්පීඑස් මල්වත්ත | එක්ස්එස් | 54834 |
| (3) | නාශාඅ | එම්ජේඑම් ෆහඩ් | එක්ස්එච් | 81520 |

ඈ. යෝගා ව්‍යායාම අවසන් වූ පසු බඩු බාහිරාදිය සහ අනෙකුත් ද්‍රව්‍ය නිසි පරිදි ගබඩා කර යතුරු එදින කොරල් කෝව් මුර කුටියේ රාජකාරි නියුතු ජ්‍යෙෂ්ඨ නාවිකයා හට ලිඛිතව භාර දීමට කටයුතු කල යුතුය.

ඉ. යෝගා පුහුණු වැඩසටහන් සඳහා පිටතින් පැමිණෙන දේශකයින් සඳහා අවශ්‍ය සියලු පහසුකම් අණභාර නිලධාරි ක්‍රිඩා පාසල හා කාර්ය මණ්ඩලයේ නාවිකයින් විසින් නිසි ක්‍රමවේදයකට අනුකූලව සපයා ගත යුතුය.

ඊ. යෝගාශ්‍රමයේ ආරක්ෂාව කොරල්කෝව් ආරක්ෂක මුරකුටියේ රාජකාරි නියුතු ජ්‍යෙෂ්ඨ නාවිකයා විසින් සොයා බැලිය යුතු අතර, පිටස්තර කිසිදු පුද්ගලයෙකු හට යෝග්‍රාශමයට ඇතුළුවීමට සහ ඒවායේ භාණ්ඩ පරිහරනය කිරීමට ඉඩ ලබා නොදිය යුතුය.

උ. යෝගාශ්‍රමය සඳහා ඉදිකර ඇති වැසිකිලි ඉබියතුරු දැමීමත්, එම යතුරුවලින් එක් යතුරක් කොරල්කෝව් මුහුදු තිරයේ රාජකාරි සිදුකරන ජොෂ්ඨ නාවිකයා හට ලබාදිය යුතු අතර අනෙක් යතුර යෝගා ව්‍යායාම සිදු කරනු ලබන ජොෂ්ඨම නාවිකයා සතුවිය යුතුය.

ඌ. යෝගා පුහුණු වැඩසටහන් සඳහා පිටතින් පැමිණෙන සියළුම පුද්ගලයින්, දේශකයින් සහ ආරාධිත අමුත්තන් සඳහා මාණ්ඩලික සටහන් පත් යොමු කිරීමේදී ක්‍රිඩා පාසලට අනුයුක්ත නිලධාරියෙකු විසින් ඉදිරිපත් කල යුතුය.

එ. දහවල් කාලයට හා රාත්‍රි කාලයට සුනඛයන් සහ අනෙකුත් සතුන් යෝගාශ්‍රමය තුලට ඇතුළුවීම වැලැක්වීම සඳහා සහ යෝගාශ්‍රමයේ ආරක්ෂාව සඳහා කොරල් කෝව් මුරකුටිය භාර දිනයේ ජොෂ්ඨ නාවිකයා විසින් වගබලාගත යුතුය.

ඒ. යෝගා වැඩසටහන් පැවැත්වෙන දිනයන් ක්‍රියාකාරී මැදිරියේ රාජකාරි නියුතු ජොෂ්ඨ නාවිකයා විසින් ආඥාපති, අණදෙන නිලධාරි,විධායක නිලධාරි පෙර දින දැනුවත් කල යුතුය.

ඔ. යෝගා ව්‍යායාමය සඳහා සහභාගී වන නාවික පුද්ලගයින්ගේ නාම ලේඛනයක් පවත්වාගෙන යාමට නානැවි එම්එම්පීඑස් මල්වත්ත එක්ස්එස් 54834 සහ නාශාඅ එම්ජේඑම් ෆභඩ් එක්ස්එච්81520 යන නාවිකයින් විසින් කටයුතු කල යුතුය.

ඕ. යෝගාශ්‍රාමය පිහිටි ප්‍රදේශය සහ යෝගශ්‍රාමය තුල කිසිදු ආකාරයකින් ආහාර ගැනීම, ආහාර පිළියෙල කිරීම, මත්පැන් සහ දුම්වැටි පානය කිරීම, කිසිදු ආකාරයක සාද පැවැත්වීම සහ යෝගා ව්‍යායාම සම්බන්ධව හැර වෙනත් කටයුතු සඳහා භාවිතා කිරීම සපුරා තහනම් වන අතර,එදින කොරල් කෝව් ආරක්‍ෂාව භාර ජොෂ්ඨ නාවිකයා මේ සම්බන්ධය සෘජුවම වගකිව යුතුය.

2. ඉහත සඳහන් උපදෙස් හා නියෝග ප්‍රකාරව කටයුතු කිරීමට සියළුම නාවික පුද්ගලයින් විසින් කටයුතු කල යුතු අතර, ඊට පටහැනිව කටයුතු කරනු ලබන නාවික පුද්ගලයින් හට විනයානුකූළව කටයුතු කරන බැව් දැන්වේ.

එස්සී අන්නතුගොඩ, ආර්එස්පී**
කපිතාන් (අවි)
අණදෙන නිලධාරී

බෙදාහැරීම :
අණභාර නිලධාරි, ක්‍රිඩා පාසල
අණභාර නිලධාරි, සිවිල් ඉංජිනේරු පාසල
ප්‍රධාන ප්‍රතිපාලක නැව් කාර්යාලය
ක්‍රියාකාරී මැදිරියේ රාජකාරි නියුතු ජොෂ්ඨ නාවිකයින්
කොරල්කෝව් ආරක්‍ෂක මුරකුටියේ රාජකාරි නියුතු ජොෂ්ඨ නාවිකයින්
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා අණභාර නිලධාරි පුහුණු පාසල්